# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා විසින් 2016 ජූනි මස 07 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 මැයි මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[112 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009990 -225 (2016/06)

## ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පූර්විකාව.

"ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සම්මේලනයක් එම සම්මේලනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එම සම්මේලනය හා සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සම්මේලනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් ඒ සම්මේලනය විසින් සාර්ථක ලෙස ඉටු කර සහ ක්‍රියාත්මක කර ඇති හෙයින් ද, ඒ සම්මේලනය සංස්ථාගත කරනු ලැබීමට දැන් ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2016 අංක      දරන "ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙම පනත ක්‍රියාත්මකවීමේ දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "සම්මේලනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කාන්තා සම්මේලනයේ දැනට සාමාජිකයන්ව සිටින්නා වූ සියලුම තැනැත්තන් ද, මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්මේලනයට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ද, ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ සම්මේලනය විසින් හා ඊට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, සම්පූර්ණ බලය සහ අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය සංස්ථාගත කිරීම.

2—PL 009930 -275 (2016/05)

සම්මේලනයේ පොදු පරමාර්ථ.

**3.** සම්මේලනය පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) කාන්තාවන්ට හා ළමයින්ට විශේෂිතව මහජන උනන්දුවක් ඇති විෂයයන් සම්බන්ධව සාකච්ඡා පැවැත්වීම ;

(ආ) කාන්තාවන්ගේ අභිවෘද්ධිය තකා ක්‍රියා කිරීම ;

(ඇ) කාන්තාවන්ගේ සහ ළමයින්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට අදාළ පොදු කරුණු සම්බන්ධ ලියකියවිලි ගොනු පවත්වාගෙන යාම හා ඔවුන්ගේ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අදාළ බලධාරීන්ට යොමු කිරීම ;

(ඈ) කාන්තාවන් සහ කාන්තා සංවිධාන මගින් ස්වාධීන පර්යේෂණ පැවැත්වීම සඳහා අනුබල දීමට අවස්ථා සලස්වා දීම ;

(ඉ) ජාති, ආගම් හා දේශපාලන අදහස් නොතකා කාන්තාවන් සහ කාන්තා සංවිධාන අතරේ සහයෝගිතාව හා හොඳ හිත ප්‍රගුණ කිරීම ;

(ඊ) සමාජයේ කාන්තාවන්ට අයත් වගකීම දැරීම සඳහා ඔවුන්ට අනුබල දීම ;

(උ) සංස්ථාවේ අරමුණු හා පරමාර්ථවලට සමාන අරමුණු හා පරමාර්ථ ඇති දේශීය හෝ විදේශීය සංස්ථාගත හෝ අනිකුත් සංවිධානාත්මක මණ්ඩල, විශේෂිත නියෝජ්‍යායතන හෝ සම්මේලනයන්ට සම්බන්ධ වීම, අනුග්‍රහය දැක්වීම, ඒවා සමග සාමූහිකව කටයුතු කිරීම, සහයෝගය දැක්වීම, ඒවාට දායක වීම හා ඒවායේ සාමාජිකයන් වීම ;

(ඌ) සම්මේලනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය, ආනුෂංගික හා හිතකර හා පොදුවේ සාමාජිකයන්ගේ යහපත, අභිවෘද්ධිය හා සුභසාධනය සඳහා සියලු දෑ කිරීම ;

සම්මේලනයේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සම්මේලනයේ අරමුදල් ආයෝජනයේ යෙදවීම සහ සම්මේලනයේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් පහ කිරීම ඇතුළුව, සම්මේලනයේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය දේ කිරීමේ, ඉටු කිරීමේ, සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සාමාජික ලේඛනය.

**5.** සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ දී සංස්ථාවේ සාමාජිකයකුව සිටින සෑම තැනැත්තකුගේම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු ලෙස යථා පරිදි ඇතුළත් කර ගන්නා සෑම තැනැත්තකුගේ ම නම, ලිපිනය, සහ සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීති යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ද සටහන් කර තබනු ලැබිය යුතු ලේඛනයක් පවත්වා ගැනීමට සැලැස්විය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**6.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන පාලකවරුන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් වෙත, මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සම්මේලනයේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ ද, මෙහි උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම පාලක සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සම්මේලනයට නව සාමාජිකයන් පත් කිරීමේ බලය සභාව සතු වන්නේ ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ යම් රීතියක් ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පැවති රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සම්මේලනයට ලැබිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංස්ථාවේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා බේරුම් කළ යුතු අතර, එදිනට සම්මේලනයට ලැබිය යුතු ව තිබුණු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සම්මේලනයේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් ලැබුණා වූ හෝ මින් මතු ලැබෙන තෙස්තමේන්තු නියාදනයකින් පැවරීම, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**10.** (1) සංස්ථාවට ලැබුණු හෝ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව සංස්ථාව විසින් නිසි අයුරින් ගිණුම් තැබීමට සැලැස්විය යුතු ය.

(2) වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින්, සෑම වර්ෂයක දී ම යටත්පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව තහවුරු කළ යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**11.** සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**12.** යම් මිලට ගැනීමක්, දායක මුදලක්, ත්‍යාගයක්, ප්‍රදානයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

**සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.**

**13.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි ණය හා බැරකම් ගෙවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරිව ඇත්නම් එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු නමුත් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ එහි යම් ආදායමක් හෝ දේපළක් එහි සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ලබා දීම හෝ මාරු කිරීම කළ යුතු ය. එම ආයතනය හෝ ආයතන සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ හෝ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය සංස්ථාගත මණ්ඩලයක හෝ යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.